0066

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි
වැඩසටහන-පස්වන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
**STU5513/STU6516 -** තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපනික ගැටලු
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.12.03 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද , 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. තුලනාත්මක අධ්‍යාපන සංකල්පය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

02. තුලනාත්මක අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදාගත හැකි ආකාර පහක් (05) දක්වන්න.

03. 1902 ද්විතීය අධ්‍යාපන පනත (බැල්ෆර් පනත) නීතිගත කිරීමේ ප්‍රයෝජන තුනක් (03) විස්තර කරන්න.

04. ගුරුවරයෙකු ලෙස ශිෂ්‍යයන් තුළ ඔබ විසින් සංවර්ධනය කළයුතු මූලික නිපුණතා හත (07) ලැයිස්තුගත කරන්න.

05. අධ්‍යාපන පද්ධතියේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව කෙරෙහි බලපාන කරුණු තුනක් (03) දක්වා දෙකක් (02) විස්තර කරන්න.

06. පෘතුගීසි පාලන සමයෙහි අධ්‍යාපන ආයතනවල සංවිධානාත්මක බව පිළිබඳ කරුණු තුනක් (03) විස්තර කරන්න.

07. "අධ්‍යාපනය ඵලදායී වන්නේ වැඩ ලෝකය සමඟ සම්බන්ධ කිරීමෙනි." නාට්‍ය හා රංගකලා විෂයයට සම්බන්ධ කරමින් මෙය පැහැදිලි කරන්න.

08. 1961 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ තුන (03) පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) පැරණි ශ්‍රී ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන ක්‍රමයේ මට්ටම් තුන (03) නම් කර, ඉන් එකක් පිළිබඳ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "ලන්දේසි පාලන සමයේ දී අධ්‍යාපනය වඩා විධිමත් විය." උදාහරණ හතරක් (04) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන මට්ටම තුළ දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණ හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i) 1932 දී හඳුන්වා දුන් "හන්දෙස්ස ක්‍රමය" හඳුන්වන්න. (ලකුණු 04)

(ii) 1981 ධවල පත්‍රිකාවේ අන්තර්ගත ප්‍රධාන ප්‍රතිසංස්කරණ හතරක් (04) දක්වන්න. (ලකුණු 08)

(iii) 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණය තුළ ද්විතීය පාසල් විෂය මාලාවට ඇතුළත් කළ නවාංග හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

11. (i) "ගෝලීයකරණය යාවත්කාලීන වන සංකල්පයකි." පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ගෝලීයකරණයේ සාධනීය ලක්ෂණ නාට්‍ය හා රංගකලා විෂය සංවර්ධනයට යොදාගත හැකි ආකාරය කරුණු හතරක් (04) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඔබේ ගුරු භූමිකාව සංවර්ධනය කර ගැනීම සඳහා 'ගෝලීයකරණ' සංකල්පය යොදාගත හැකි ආකාර හතරක් (04) උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) ජපානයේ 1947 අධ්‍යාපනය සඳහා මූලික නීතියෙහි ප්‍රධාන මූලධර්ම හතර (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ජපානයේ ද්විතීයික අධ්‍යාපනයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් (02) දක්වා ඒවා ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනයේ නාට්‍ය හා රංගකලා විෂය සංවර්ධනයට යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ජපානයේ උසස් අධ්‍යාපනය තුළ තාක්ෂණය යොදා ගන්නා ආකාරය කරුණු හතරක් (04) ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

13. (i) “මානව සංවර්ධනය” යන සංකල්පය සඳහා ඔබේම නිර්වචනයක් දක්වන්න. (ලකුණු 04)

(ii) මෙරට අධ්‍යාපන පද්ධතියේ නාට්‍ය හා රංගකලා විෂය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා මුහුණ දෙන ගැටලු හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහතින් දැක් වූ ගැටලු විසඳා ගැනීම සඳහා කළහැකි යෝජනා හතරක් (04) උදාහරණ සහිත ව දක්වන්න. (ලකුණු 08)

14. (i) ඉංග්‍රීසි පාලන සමය තුළ මෙරට ආණ්ඩු කළ ආණ්ඩුකාරවරු දෙදෙනෙකු (02) නම් කර, ඉන් එක් අයෙක් යටතේ අධ්‍යාපනයේ ඇති වූ ධනාත්මක වෙනස්කම් දෙකක් (02) දක්වන්න. (ලකුණු 04)

(ii) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී පිහිට වූ කෝල්බෲක් කොමිසම අධ්‍යාපනය සම්බන්ධ කරන ලද යෝජනා හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) “බ්‍රිතාන්‍ය පාලනය තුළ මිෂනාරිවරුන්ගේ භූමිකාව” කරුණු හතරක් (04) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.